# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/120/2025 (PSC)

**සුමිත්‍රා වික්‍රමසිංහ රාජපක්ෂ**
**අභියාචක**
**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.02.25**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක පී.පී.ආර්.කුමාර මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් නිලූකා කුමාරි මිය.

**-නියෝගය-**

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

අභියාචක සුමිත්‍රා වික්‍රමසිංහ රාජපක්ෂ නැමැති අය විසින්, 2025.04.30 දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඇයව නැවත සේවයේ පිහිටුවීමට නියෝගයක් ලබාදෙන ලෙසයි. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂක ජනරාල්ගේ 2023.06.30 දිනැතිව නිකුත් කරන ලද ලිපිය අනුව ඇයගේ පත්වීම අහෝසි කර ඇත. එම ලිපිය පැ.13 ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ වාර්තාව සමග ඉදිරිපත් කර ඇත. එහි සඳහන් වන්නේ අභියාචක කාර්යාල සේවක සේවයේ III පන්තියේ තනතුරක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අධ්‍යාපන පොදු සහතික (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය ව්‍යාජ ලේඛනයක් බව තහවුරු වීම හේතුවෙන්, එම පත්වීම අහෝසි කරන ලද බවයි. අභියාචක විසින් ඉහත කී පත්වීම ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අධ්‍යාපන සහතිකය, ඉහතකී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ වාර්තා සමග ඇමුණුම් 03 ලෙසට සළකුණු කර ඉදිරිපත් කර ඇත. එම අධ්‍යාපන

සහතිකයට අනුව අභියාචක විෂයන් 07ක් පමණක් සමත්වී ඇති අතර, බුද්ධාගම විෂයට විශිෂ්ඨ සාමාර්ථයක්ද, සිංහල භාෂාව සහ ගෘහ විද්‍යාව, ඉතිහාසය සහ චිත්‍ර විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ද ලබාගෙන ඇත. නමුත්, විභාග දෙපාර්තමේන්තුවෙන් විමසා බැලීමෙන් අනතුරුව නිකුත් කරන ලද ලිපියට අනුව, ඇය සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල ලෙසට විෂයන් පහක් පමණක් සමත් බවත්, බුද්ධාගම විෂයට විශිෂ්ඨ සම්මානයක් ද, සිංහල භාෂාව සහ ගෘහ ආර්ථික විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයක්ද, ඉතිහාසය සහ චිත්‍ර විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබාගෙන ඇති බවට සඳහන් වේ. ඉහත කී කරුණු අනුව අභියාචක විසින් වැරදි තොරතුරු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක්, ඇය විසින් රැකියාව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බව පැහැදිලිව පෙනී යයි.

ඉහත කී තත්ත්වය ප්‍රතික්ෂේප කළ නොහැක. එම කරුණ අභියාචක ද ප්‍රතික්ෂේප කරන්නේ නැත. එබැවින් අභියාචකගේ සේවා කාලය හෝ වයස සළකා බැලීම මත පමණක් අභියාචක විසින් ඉල්ලා ඇති පරිදි සහනයක් ලබා දීමට හැකියාවක් ලැබෙන්නේ නැත.

වැරදි සහගත කරුණු ඇතුළත් අධ්‍යාපන සහතිකයක් ලබාදීම හේතුවෙන්, අභියාචකගේ සේවය නතර කර තිබීම හේතුවෙන්, ඉදිරිපත් කර ඇති මෙම අභියාචනයට අවසර ලබාදීමට හැකියාවක් ලැබෙන්නේ නැත.

ඉහත කරුණු සළකා බලා, අභියාචකගේ අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-